**මස්කෙළිය ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව හා සම්බන්ධ නඩු 08 ක් පැවතියද, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | හෙළිදරව් කිරීම් 2023 මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට දක්වන බව | නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.66,200 ක ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | එකතුව රු.57,200 ක භාණ්ඩ 67ක ගබඩා තොග හා රු.350,560 ක කාබනික පොහොර තොග ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.1,053,852 ක දැන්වීම් පුවරු ආදායම් බිල් කර තිබුණද, වර්ෂයේ ආදායම ලෙස රු.109,128 ක් ගිණුම් ගත කිරීම හේතුවෙන් රු.944,724 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.79,128 ක දැන්වීම් පුවරු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | - එම - | වර්ෂයේ ආදායම් නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම් රු.1,028,852 ක් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන අති | අප්කට් මීරියකොටවේ වතුයායේ 2018 වර්ෂයේ සිට සංවර්ධනය කර විකුණන ඉඩමට අදාළව ප්‍රජා | අදාළ ඉඩම් කොටස සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | විශේෂ ගැසට් පත්‍රයේ පලකළ සැළසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය | හා විනෝද කටයුතු සඳහා ලබාගත යුතු අක්කර 1.9 ක බිම් ප්‍රමාණය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කරමින් පවතින බව | |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>-------------------------------------- | | | |
| I. | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන චක්‍රලේඛය<br>(i) 1 (III) ඡේදය | කඩ කාමර 8ක එක්වන් මුදල එකවර ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් බදු ගිවිසුම් අත්සන් කර නොතිබිණි | අදාළ චක්‍රලේඛයට අනුව දැනට එම කඩ කාමර ව්‍යාපාර කටයුතු කරගෙන යන පාර්ශවයන් සමග ගිවිසුම් ගත වීමට කටයුතු සූදානම් කර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 08 (I) ඡේදය | කඩ කාමර 07 ක බදුකරු නොවන වෙනත් පාර්ශවයන්ට අතුරු බදු දී තිබුණි. | කඩ කාමරවල ව්‍යාපාර කටයුතු කරගෙන යන පාර්ශවයන් සමග ගිවිසුම් ගත වීමට කටයුතු සූදානම් කර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| II. | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 05 කට වරක්වත් සිදුකළ යුතු වුවද, ප්‍රාදේශීය සභාව 2010 වර්ෂයට පසුව එසේ වරිපනම් බදු දේපල තක්සේරු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කොට ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| III. | 2016 මාර්තු 17 දිනැති අංක මප/පා.පා.කො/2016/03 දරන චක්‍රලේඛය | කඩ කුලිය වසර 05 කට වරක්වත් සංශෝධනය කළ යුතු වුවද, එසේ කටයුතු නොකර 2009 වර්ෂයේ තක්සේරු කළ කුලී මත කඩ 12 ක කුලී අයකරමින් පැවතුණි | මධ්‍යම පළාත් ප.ප.කො චක්‍රලේඛ අනුව නව ගිවිසුම් වලට එළඹීම සඳහා මූලික කටයුතු සිදු කර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.505,237 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,046,051 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,129,674 | 3,431,933 | 4,302,044 | 1,358,047 | 5,073,570 | 3,091,131 | 3,508,880 | 2,228,158 |
| (ii) | කඩ කුලී | 8,232,900 | 5,148,100 | 3,727,413 | 3,933,984 | 9,349,160 | 4,900,500 | 6,870,840 | 2,513,297 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,511,000 | 1,391,422 | 1,391,422 | - | 1,711,000 | 1,200,000 | 994,492 | - |
| (iv) | වෙනත් ආදායම් | 63,050,973 | 2,376,301 | 1,692,400 | 2,764,492 | 61,836,293 | 6,000,000 | 23,629,490 | 2,080,591 |
| | | 76,924,547 | 12,347,756 | 11,113,279 | 8,056,523 | 77,970,023 | 15,191,631 | 35,003,702 | 6,822,046 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.760,738 ක හිඟ ශේෂයක් පැවති අතර ඉන් වසර 04 කට වැඩි කාලයක සිට පවතින වරිපනම් ඒකක 65 කින් රු.446,166 ක් අය විය යුතුව පැවතුණි. | වරිපනම් බදු නොගෙවන්නන් සඳහා දේපළ තහනමට ගැනීමට නියමිත බව | හිඟ ආදායම් කළ යුතුය. |
| (ආ) | කුලී<br>2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසයකට අදාළව කඩ කාමර 22 කින් රු.2,141,384 ක කඩකුලී අය කරගෙන නොතිබුණි. | අයවිය යුතු මුදල් සඳහා නීතිමය කටයුතු වල මූලික පියවරයන් දැනටමත් ආරම්භ කොට ඇති බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ඇ) | වෙනත් ආදායම්<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.947,772 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර නොතිබුණු අතර නියැදි පරීක්ෂාවට අනුව බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු 120 කින් රු.491,025 ක ගාස්තු බිල්කර නොතිබුණි. | 2023 වර්ෂය තුල අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | ආදායම් අයකළ යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 2,255,512 ක් හා මුද්දර ගාස්තු රු.508,880 ක් විය. | උසාවි දඩ ගාස්තු ලබා ගැනීම සඳහා අදාළ උප ලේඛන සමඟ ඉල්ලීම් ලිපි ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

1987 අංක 05 ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අප්කට් නගරයේ ප්‍රධාන වීදියේ ව්‍යාපාර ස්ථාන හා පදිංචිය සහිත ගොඩනැගිලි මාර්ගයට ආසන්නයේ ඉදිකර තිබීම හේතුවෙන් පදිකයින්ට ගමන් කිරීම සඳහා පදික වේදිකාවක් නොතිබුණු අතර මාර්ගය දෙපස කානු පද්ධතිය අවහිර වන අයුරින් ඉදිකිරීම් සිදුකර තිබුණි. ව්‍යාපාර හා නිවෙස්වල අපජලය ප්‍රධාන මාර්ගයට මුදාහැර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉදිරියේදී සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මස්කෙළිය අංක 2 වන වීදියේ පැවති පොදු වැසිකිළිය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමකින් තොරව විනාශවීමට ඉඩහැර තිබුණු අතර බස්නැවතුම්පල අසල පොදු වැසිකිළියේ පහළ මහලේ වැසිකිළි කාමර දෙකක් වසා දමා තිබුණි. | පිරිසිදු කර භාවිතයට ගත හැකි මට්ටමට සකස් කර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශයේ මාර්ග කිලෝමීටර් 05 ක් සමාලෝචිත වසර තුළ සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණු අතර එහි ප්‍රගතිය සියයට 85 ක් ලෙස කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබුණද වසර තුළ මාර්ග ව්‍යාපෘති 02 ක් යටතේ මීටර් 500 කට අඩු ප්‍රමාණයක් සංවර්ධනය කර තිබුණි. | වසර තුල ක්‍රියාත්මක කරනු ලබන කාර්ය සාධන දර්ශක ප්‍රතිශතය වර්ධනය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | සැලසුම් ප්‍රකාරව කාර්යයන් නිම කිරීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ජල ටැංකි 13 ක් රූපවාහිනි යන්ත්‍ර 01 ක් හා මස්කෙළිය ළමා උද්‍යානයේ හා රිකාටන් කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයේ උපකරණ 10 ක් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. මෙම උපකරණ ඉන්වෙන්ට්‍රි ගත කර ද, නොතිබුණි. | වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව | ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් ඉඩම් හා ගොඩනැගිලි 22 ක් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩම් හා ගොඩනැගිලි නිවැරදි වටිනාකම් සහිතව හඳුනාගෙන ගිණුම් ගත කරන බව | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන රිකාටන් කසළ අංගනය පිහිටි ඉඩම හා තවත් ඉඩම් 35 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් හා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බව | ඉඩම්වල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | මස්කෙළිය සභාවට අයත් නිවාසය සහිත ඉඩමේ වැට මායිම් සළකුණු කර නොතිබුණු අතර ඉඩමේ අනවසරයෙන් නිවසක් ඉදිකර තිබුණි. | නිල නිවාසය අළුත්වැඩියා කර ඇති අතර එහි පවතින අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් හැටන් දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බව | වත්කම් නිසි ලෙස නඩත්තු කර අනවසර පිවිසුම් වළක්වා ගත යුතුය. |
| (ඇ) | මස්කෙළිය පොදු සුසාන භූමියේ වැට මායිම් නොතිබුණු අතර සිමෙන්ති යොදා ස්ථිරවම වල බැඳ ස්මාරක ඉදිකර තිබුණි. මේ සඳහා ගාස්තු අය කිරීමක් හෝ සභාවෙන් අවසර ලබා ගැනීමක් සිදුකර නොතිබුණි. සභාවේ අනුමැතියකින් තොරව භූමදාන කටයුතු සිදුකර තිබුණි. | වැට අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු අමාත්‍යාංශය වෙත යවා ඇති බව | වත්කම් අළුත්වැඩියා කර නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සීත ගඟුල විශ්‍රාම ශාලාව හා ගඟුලතැන්න විශ්‍රාම ශාලාවේ වහලය කැඩී දිරාපත්වී ගොඩනැගිලි අබලන් තත්ත්වයේ පැවති අතර නල්ලතන්නිය ප්‍රධාන රථවාහන අංගනයේ පිහිටි මුළුතැන්ගෙය ඇතුළු මෙම ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කරන බව | වත්කම් අළුත්වැඩියා කළ යුතුය. |

**3. 4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට තනතුරු 16 ක පුරප්පාඩු 68 ක් පැවතුණ අතර ඉන් සෞඛ්‍ය කම්කරු 21 ක් ක්ෂේත්‍ර කම්කරු 15 ක් පුරප්පාඩු වී පැවතිණි. | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරු අනුමත කළ යුතු බැවින් මෙතෙක් පුරප්පාඩු පිරවී නොමැති බව | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. |

### 3.5 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවට අයත් වාහන 02 ක් අළුත්වැඩියාව සඳහා වසර 04 කට පෙර පෞද්ගලික ගරාජයක අළුත්වැඩියාව සඳහා භාර දී තිබුණද අළුත්වැඩියා නොකර සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා අදාළ ගරාජයේ ගාල් කර තිබුණි. | ප්‍රතිපාදන නොමැති වීම මත වාහන අළුත්වැඩියාව සඳහා යොමු කිරීමට නොහැකි වූ බව | වාහනය අළුත්වැඩියා කර ගෙන්වා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 04 සිට සියයට 70 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 07 සිට සියයට 85 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | විචලනයන් අවම වන පරිදි අයවැය ලේඛනය සකස් කිරීමට කටයුතු කරන බව | අවශ්‍යතාවය සලකා බලා නිසි අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නල්ලතන්නිය පුදබිම ආශ්‍රිතව පෞද්ගලික ඉඩම් හිමිකරුවකු විසින් හා ආගමික ස්ථානයක් විසින් විශාල වශයෙන් පස් කපා දමා ගොඩනැගිලි හා තාප්ප ඉදිකර පස් හා ගල් අසල ජල මාර්ගයට බැහැර කර පරිසර හානියක් සිදුකර තිබුණි. එසේම තවත් ස්ථානයක අනවසරයෙන් කැලෑ ප්‍රදේශ එළිකර බ්ලෝක් ගල් මඟින් කබානා ඉදිකරමින් පැවතුණි. | නල්ලතන්නිය පුදබිම අවට සිදු කරනු ලබන අනවසර ඉදිකිරීම් සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන බව | අනවසර ඉදි කිරීම් සම්බන්ධව නීතිමය පියවරගත යුතුය. |

### 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ තිරසර සංවර්ධන අරමුණු 07 ක් ඔස්සේ ඉලක්ක 22 ක් පිහිටුවාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිට පරීක්ෂණයට භාජනය වූ ඉලක්ක 11 ක් ඉටු කරගෙන නොතිබුණි. | අඩුපාඩු අවම කරමින් අදාළ ඉලක්ක සපුරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව . | පිහිටුවාගත් ඉලක්ක අනුව කටයුතු කළ යුතුය. |